

# මුල් ළමා විය සංවර්ධනය කරමු


කොළඹ විශ්වවිද්‍යාලයයේ අධ්‍යාපන මනෝ විද්‍යා අංශයේ අංශාධිපති,
නීතිඥ මහාචාර්ය
**රෝලන්ඩ් අබේපාල**

**දේශයක අනාගත ආයෝජනය යහපත් දරුවන් ය. මෙලොව දුටු දා පටන් ඔවුන් ලබන අත්දැකීම් හා පන්නරය හෙට දවසේ ලොවට ම හැඟි මානව සම්පතක් දායාද කිරීමට සමත් ය. මේ තරගකාරී ලෝකය ජය ගැන්මට ඔවුහු සූදානම් විය යුත්තෝ ය. ජීවිතයේ ඉතා සංකීර්ණ සේම තීරණාත්ම අවධිය වන ළමා කාලය පිළිබඳ වැඩිහිටි පරපුරේ විශේෂ අවධානය යොමු විය යුතු ය.**

ළමා සංවර්ධනය පිළිබඳ නව සොයා ගැනීම් මඟින් හෙළි වන පරිදි පුද්ගලයකු ගේ පෞර්ෂ වර්ධනයෙන් 50% ක් ගොඩනැඟෙන්නේ ළමා කාලය තුළ දී ය. ඉතිරි 20% වර්ධනය වන්නේ ජීවිතයේ සෙසු අවධීන්හි දී ය. මේ අනුව, ළමා අවධියේ පළමු වසර පහ ජීවිතයේ වැදගත් අවධියක් ලෙස තවදුරටත් සිතිය හැකි ය. ඒ අතරින් ද මුල් වසර තුන ඉතා වැදගත් ය. මෙම කාලය තුළ දරුවකු ගේ සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය. එහි වැදගත්කම පිළිබඳ යුනෙස්කෝව මඟින් ලොව පුරා දැනුවත් කිරීම් සිදු කරන අතර එය හඳුන්වන්නේ මුල් ළමාවිය සංවර්ධනය ලෙසිනි.

බිළිඳකු මොලොව එළිය දකින විට ප්‍රයෝජනයට නොගත් නැවුම් සෛල බිලියන ගණනක් ඔහු / ඇය සතු වේ. මුල් ළමා විය සංවර්ධන කාර්යයේ දී පෝෂණය හා සෞඛ්‍යය, ආදරය, යහපත් සමාජ පරිසරයක් නිර්මාණය කිරීම, රැකවරණය, හා ආරක්ෂාව, සේම ක්‍රීඩාවලට යොමු කිරීමෙන් ද මෙම සෛල පවත්වා ගත හැකිය. කෙළි සෙල්ලම් ආදිය මේ අවධියේ දරුවන් කෙරෙන් බහුලව දැකිය හැකිය.

එයින් තොර ළමා අධ්‍යාපනය පිළිබඳ කතා කිරීම පවා උගහටය. ඒ තුළින් ඔවුහු බොහෝ අත්දැකීම් ලබා ගනිති. මෙලෙස සිය සෛල ප්‍රයෝජනයට ගන්නා දරුවන් යහපත් පෞර්ෂයකින් හොබනේ ය.




බිළිඳකු මෙලොව එළිය දකින්නට පෙර සිටම මව , පියා මේ පිළිබඳ දැනුවත් වී සිටීම වැදගත්ය. මන්ද නිසි පෝෂණය, හා මව්පියන් ගේ දැනුම යහපත් දරු උපතක් සඳහා තුඩු දෙන හෙයිනි. මන්දපෝෂණයෙන් පෙළෙන දරුවකු බිහි වූ විටෙක, එම දරුවන් අධ්‍යාපනයේ දී ද බෙහෙවින් පසුගාමී ස්වාභාවයක් උසුලයි. මේ අනුව පෝෂණය රටක අධ්‍යාපනයට තුඩුදෙන කරුණක් වන අතර , කුඩා කල සිට ම මුල් ළමා විය සංවර්ධනය , රටක ආර්ථික සංවර්ධනයේ ලකුණකි. මේ නිසාම ලොව බොහොමයක් රටවල් මෙම සංකල්පය කෙරෙහි විශේෂ අවධානය යොමුකර ඇත.

මෙම අවධියේ දරුවකුගේ රුචි අරුචිකම් ඔහුගේ/ඇයගේ සමාජ ජීවිතයට සෘජු ලෙස ම බලපායි. මසක් වයසැති බිළිඳකු නිමේෂයකට හිස කෙළින් කරන්නේය. බිළිඳා අතට ගත් විට නිශ්ශබ්දතාව පළ කරන්නේය. එසේම ශබ්දයක් ඇසුණ විටක දී තිගැස්සෙන්නේ ය.වසරක් සපිරුණු දරුවා යමක් අල්ලා ඇවිදීමට උත්සාහ කරන අතර සරල ක්‍රීඩාවන්හි යෙදෙයි. තේරුම් සහිත වචන එකක් දෙකක් පවසයි. වයස අවුරුදු දෙකේදී දරුවාගේ ස්වාභාවය ඊට තරමක් දියුණු මට්ටමක පවතී. පහසුවෙන් ඇවිදින ඔහු සිරුරේ විවිධ කොටස් හඳුනන අතර විවිධ දේ නම් කිරීමටද සමත්කම් දක්වයි.

පෙර පාසල යනු , දරුවකුට අකුරු ලියන්න කියන්න උගන්වන තවත් පාසලක් පමණක් නොවේ. දරුවකුගේ හසුරු කුසලතා වර්ධනය (පැන්සල අල්ලන ආකාරය , ඉන් අඳින ආකාරය), අන්‍යෝන්‍ය සහයෝගිතාව, චිත්ත වේග පාලනය,ආදී ප්‍රවේශ කුසලතා එහිදී සංවර්ධනය කෙරේ. මෙම ප්‍රවේශ කුසලතා සංවර්ධනය පහත පරිදි කොටස් කිහිපයකට බෙදා දැක්විය හැකි අතර එයින් පූර්ණ වූ විට දරුවා විධිමත් අධ්‍යාපනය ලැබීමට සුදුස්සෙකි.

මේ අනුව දරුවකු ගේ බෙහෙවින් වැදගත් අවධිය මෙය වන අතර ඊළඟට එළැඹෙන්නේ පෙර පාසල් අවධියයි.

මෙය මුල් ළමා විය සංවර්ධනයේ දෙවැනි භාගය (අවුරුදු 3-5) ලෙස හඳුනා ගනිමු.මෙම කාලය හා මුල් අවුරුදු ද්විත්වය අතර පැහැදිලි වෙනසක් අපට හඳුනාගත හැකිය. දරුවකුගේ ශාරීරික සංවර්ධනය , එනම් බාහිර හා අභ්‍යන්තර ඉන්ද්‍රියන්ගේ වර්ධනය මුල් අවුරුදු තුනේදී සිදුවෙයි. එහි අපර සමය වැදගත් වන්නේ දරුවකුගේ අධ්‍යාපනය සම්බන්ධයෙනි. විවිධ හැසිරීම , චර්යා රටා , ගති සිරිත් , තර්කනය, මතකය, ඇදහීම්, භාෂාව, ආදිය මේ අවධියේ දී සංවර්ධනය වේ.

පළමුව සිය නිවෙස ආශ්‍රිත පරිසරයෙන් මෙවැනි දෑ උගන්නා දරුවා ඊළඟට යොමුවන්නේ පෙර පාසල වෙතටය. මෙම කාර්යයේ ලා වැඩි වගකීමක් හා දායකත්වයක් එමඟින් දරුවාට ලැබේ.

සෑම දරුවකු ම පෙර පාසල් යා යුතු වන්නේ එහෙයිනි. ඒ වනාහි විධිමත් පාසලකට දරුවකු සූදානම් කරන ස්ථානයයි. පෙර පාසල යනු , දරුවකුට අකුරු ලියන්න කියන්න උගන්වන තවත් පාසලක් පමණක් නොවේ. දරුවකුගේ හසුරු කුසලතා වර්ධනය (පැන්සල අල්ලන ආකාරය , ඉන් අඳින ආකාරය), අන්‍යෝන්‍ය සහයෝගිතාව, චිත්ත වේග පාලනය,ආදී ප්‍රවේශ කුසලතා එහිදී සංවර්ධනය කෙරේ. මෙම ප්‍රවේශ කුසලතා සංවර්ධනය පහත පරිදි කොටස් කිහිපයකට බෙදා දැක්විය හැකි අතර එයින් පූර්ණ වූ විට දරුවා විධිමත් අධ්‍යාපනය ලැබීමට සුදුස්සෙකි.

01. **නිපුණතා** : - හුරු පුරුදු කෞශල්‍යය (පෑන / පැන්සල නිවැරදිව ඇල්ලීම) - ශාරීරික ක්‍රියාකාරකම් (ක්‍රීඩා)

02. **වාචික ක්‍රියාකාරකම්** (සන්නිවේදනය) – නම,ගම, වයස ආදිය ඇසූවිට කීමේ හැකියාව

03. **සමාජ කුසලතා** - සහයෝගිතාව,ඉවසීම, දුක,තරහව ආදී චිත්තවේග පාලනය.

දරුවකු යමක් කළ විට නිතර "එපා" යයි නොකියා එහි ප්‍රතිවිපාක පෙන්වා දීමත්, ඔහු / ඇය කරන දෑ අගය කිරීමත් ඉතා වටිනා සංකල්පයන් ය. පෙර පාසලට යන්නට මත්තෙන් හා එම අවධියේ බොහෝ දරුවන් පසුවන්නේ ආයම්මා හෝ අත්තම්මා ළඟ ය.

මෙම අවධියේ දී දරුවෝ සෑම දෙයක් පිළිබඳම අවධානයෙන් විවිධ ප්‍රශ්න කිරීම් කරති. ඒවාට නිවැරදි පිළිතුරු දීමට මෙම ආයම්මා හෝ ආත්තම්මා දැන සිටිය යුතුය. උදාහරණයක් ලෙස,

## 05



වැඩිහිටි පිරිමි ළමයකුගෙන් "අර බස් එක කොහේද යන්නේ" යැයි අසන දරුවකුට "අපායට" යැයි පිළිතුරු ලැබුණොත් අපායේ කවුද ඉන්නේ ? යැයි නැවත දරුවා ප්‍රශ්න කරනු ඇත. ඒ පිළිතුර යකුන් යැයි අභිරූපණයෙන් පෙන්වූවොත්, එතැන් සිට දරුවා බස් රියට බය වෙයි. මෙවන් අඥාන කතාවලින් දරුවන් බිය ගැන්වීම ඔවුන් ගේ හැකියාවන් සමාජ දැනුම පවා මොට කිරීමට සමත් වේ.

එළවළු මල්ල ලිහන විට අසල සිටින දරුවා කැඳවා ඒවා වෙන් කිරීමට ඔහු ගේ /ඇය ගේ සහාය ලබාගන්න. එවිට මෑ, බෝංචි, අල, පරිප්පු වෙන් කර හඳුනා ගැනීමට දරුවා සමත් වෙයි. මෙවන් වූ ක්‍රියාකාරකම් සඳහා ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුක්තව දරුවන් සමඟ ගණුදෙණු කිරීමට දරුවන් බලා කියා ගන්නවුන් සමත් විය යුතු ය. මෙවන් වැඩිහිටියන්ගේ ප්‍රතිචාර දරුවා ගේ දැනුම වර්ධනය කිරීමට රුකුලක් වන අතර සිය වටාපිටාව ගවේෂණය කරන දරුවා, නිරන්තරයෙන් එකී දිරිගැන්වීම්වලට අනුව හැඩ ගැසෙයි.

පෙර පාසල් දරුවකු සිය වයස් මට්ටම අනුව ගැටලු විසඳා ගැනීමේ යම් හැකියාවකින් හොබනේ ය. යමක් සැලසුම් කිරීමට හේ දක්ෂ ය. ක්‍රියාකාරීව හා සිය හැඟීම් විවෘතව ප්‍රකාශ කරන ඔවුහු ඒවා ක්‍රියාවට නැංවීමට ද පෙළැඹෙති. එවන් විටෙක වැඩිහිටියන් ඔවුන්ට සිය සහයෝගිතාව පළ කළ යුතු අතර, මඟපෙන්වීම සිදු කළ යුතු ය. පෙර පාසල් දරුවකු සමඟ කතාන්දරයක් හෝ වෙනත් යමක් කියා දෙමින් දිනකට පැය භාගයක පමණ කාලයක් ගත කරන්නේ නම් එය දරුවාගේ කියැවීමේ රුචිය වර්ධනය කරවයි. දුකක් කරදරයක් වූ විටෙක දී අන්‍යයන්ට පිහිට වන ආකාරය, යමක් කිරීමේ දී ඉන් අත්වන ප්‍රතිවිපාක කෙරෙහි ද මේ අවධියේ දරුවෝ උගනිති. ඒවා සිය පවුල් පරිසරයේ ස්වභාවය අනුව ගොඩ නැඟෙන අතර මේ සම්බන්ධව වැඩිහිටියෝ උනන්දු විය යුත්තෝය.

ආගම දහමේ හරයන් කෙරෙහි වැඩි අවධානයක් දක්වන දරුවා විවිධ ක්‍රියාකාරකම් හි ආදීනව මේ අවධියේ දී හඳුනා ගනී. එසේම සත්‍ය හා බොරුව අතර වෙනස වටහා ගැනීමට ද ඔවුහු සමත් වෙති. මෙහි දී දරුවාගේ ස්ව අභිමානය වර්ධනය කිරීමට අවශ්‍ය වටාපිටාවක් නිවසේ පරිසරය තුළ ගොඩ නැංවිය යුතු ය. පෙර පාසලේ දී මෙම කටයුත්ත සිදු කෙරුණත්, නිවසේ දී දරුවා පසු පස

පෙර පාසල් දරුවකු සමඟ කතාන්දරයක් හෝ වෙනත් යමක් කියා දෙමින් දිනකට පැය භාගයක පමණ කාලයක් ගත කරන්නේ නම් එය දරුවාගේ කියැවීමේ රුචිය වර්ධනය කරවයි. දුකක් කරදරයක් වූ විටෙක දී අන්‍යයන්ට පිහිට වන ආකාරය, යමක් කිරීමේ දී ඉන් අත්වන ප්‍රතිවිපාක කෙරෙහි ද මේ අවධියේ දරුවෝ උගනිති. ඒවා සිය පවුල් පරිසරයේ ස්වභාවය අනුව ගොඩ නැඟෙන අතර මේ සම්බන්ධව වැඩිහිටියෝ උනන්දු විය යුත්තෝය.

යමින්. සැර වැර වෙමින්, එපා බෑ යන වදන්වලින් වැඩිහිටියෝ මෙම පොඩිහිටියෝ පෙළති. එය ඔවුන් ගේ පෞර්ෂ වර්ධනයයෙහි ලා බලපාන ප්‍රබල ගැටලුවකි. කවි කතාන්තර කියමින් හෝ සෙල්ලම් කරමින් හෝ දරුවා සමඟ සහ සන්නිවේදනය වර්ධනය කර ගනිමින්, එම ක්‍රියාකාරකම්වලට ප්‍රතිචාර දැක්වීම දරුවකු තුළ යහපත් මානසික වර්ධනයක් ඇති කරවීමට තුඩු දෙයි.

මෙහිදී නිවෙස ආශ්‍රිතව පවතින අනතුරු අවම කරමින් දරුවාට අවශ්‍ය ආරක්ෂාව සැපයිය යුතු ය. එසේම පරිසරය ඇසුරින් අත්දැකීම් ලබා ගැනීමටත්, යහ පුරුදු පුහුණු වීමටත්, නිපුණතා වර්ධනයටත් දෙමාපියෝ දරුවන්ට අත්වැල සැපයිය යුත්තාහ. ස්වාධීන තීරණ ගැනීමට දරුවා යොමු කරමින් ආකල්ප වර්ධනයට දෙගුරුන් අත දිය යුත්තෝ ය.

මෙම මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථානයක්,

* පාරිසරික සාධක
* භෞතික අවශ්‍යතා
* සෞඛ්‍යමය අවශ්‍යතා
* පෝෂණ අවශ්‍යතා
* මනෝ සාමාජීය සත්කාරක අවශ්‍යතා
* ඉගෙනුම් පරිසරය
* පරිපාලන අවශ්‍යතා
* ආගමික පරිසරය
* විශේෂිත ළමයින් හඳුනාගැනීමේ හැකියාව
* සුදුසුකම් සහිත ගුරුවරුන් සිටීම
* ආදී අංශවලින් පරිපූර්ණ වී තිබීම අත්‍යවශ්‍ය ය.

එහෙත් මෙරට පවතින මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයන්, එකී ප්‍රමිතීන් සියල්ල සපුරන්නේදැයි ගැටලුවකි. ඒවායේ විවිධ ගැටලු බොහොමයකි. බොහොමයක් මධ්‍යස්ථාන අවම ප්‍රමිතීන්වත් සපුරා නැති අතර තරගකාරී අනම්‍ය ස්වරූපයක් උසුලයි. මෙහිලා විශේෂිතම කරුණ වන්නේ මේ පිළිබඳ මාපියන් ගේ නොදැනුවත්කමය. විවිධ ආර්ථික අපහසුතා හේතුවෙන් ඇතැම් ළමෝ මෙවැනි මධ්‍යස්ථාන කරා යොමු නොවීම ද ගැටලුවකි. පරිපාලනමය දුර්වලතා මෙන්ම මේ සම්බන්ධයෙන් ළමා ලේකම් කාර්යාලයයේ නිවැරදි මඟ පෙන්වීමක් නොමැතිකම ද අවධානය යොමු විය යුතු කරුණකි.

සටහන

**නිලූකා ඩී.තිලකරත්න**